# බළන්ගොඩ නගර සභාව

## 2022-11-08 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2022.11.08**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්.ජ්. වසන්ත ගුණරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | ඩබ්.ජ්. වසන්ත ගුණරත්න මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්.ටී.එම්.රූමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | නිමල් කරුණාරත්න මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 9. ගරු නාගරික මන්ත්‍රී | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රිනී | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 12. ගරු නාගරික මන්ත්‍රීනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 13. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. පේමදාස මැතිතුමා |
| 15. ගරු නාගරික මන්ත්‍රීනී | මංගලිකා ඉලංකෝන් මැතිතුමිය |
| 16. ගරු නාගරික මන්ත්‍රී | එස්.ඒ.ජෝර්ජ් මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

**01. පසුගිය සභාවේ 2022-10-11 දිනැති මහා සභා වාර්තාව හා 2022-10-31 දිනැති විශේෂ මහ සභා වාර්තාව සභා සම්මත කිරීම.**

මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා, ආගම සිහි කිරීමෙන් අනතුරුව සභාව සඳහා සහභාගි වූ ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගන්නා ලදී.

ඉන් අනතුරුව 2022-10-11 දින පැවති මහ සභාවේ සභා වාර්තාව හා 2022-10-31 දිනැති විශේෂ මහ සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා, 2022-10-11 දින පැවති මහ සභාවේ සභා වාර්තාව හා 2022-10-31 දිනැති විශේෂ මහ සභාවේ වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමා විසින් මෙදින සභා වාර්තාවේ සංශෝධනයන් තිබේදැයි විමසූ අතර, සංශෝධන කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2022-10-11 දින පැවති මහ සභාවේ සභා වාර්තාව හා 2022-10-31 දිනැති විශේෂ මහ සභාවේ වාර්තාව ගරු සභාවේ සභා සම්මත විය.

**ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා පෙ.ව 10.06 ට පමණ සභාවට පැමිණෙන ලදී.**

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

- ශ්‍රී ලංකාවේ මේ වන විට විශාල වශයෙන් ඖෂධ හිඟයක් පවතින අතර, එයට යම් විසඳුමක් වශයෙන් පසුගිය දිනක සිංහ සමාජය විසින් බළන්ගොඩ මූලික රෝහල සඳහා රුපියල් මිලියන 100 ක ඖෂධ ලබා දුන් බව ද ඒ සඳහා මූලිකත්වය ගෙන කටයුතු කළ ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමාට ස්තුතිවන්ත වන අතර, බළන්ගොඩ ප්‍රධාන පුරවැසියා වශයෙන් තමන්ට කල ආරාධනය පිළිබඳ ස්තුතිවන්ත වන බව ද ඉදිරියටත් මෙවැනි සත්කාර සිදු කිරීමට ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරන බව ද පවසන ලදී.

- නිපොලැක් ආයතනය විසින් බළන්ගොඩ මොහාන් සාලිය එල්ලාවල මාවතේ මල් පෝච්චි, තීන්ත ආලේප කර අලංකාර ලෙස සකස් කර තිබෙන අතර, ඒ සඳහා මැදිහත් වූ එම ආයතනයටත් සම්බන්ධීකරණය කළ ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමාටත් ස්තුතිවන්ත වන බව පැවසීය.

- අසනීප තත්ත්වයන් හේතුවෙන් 2022-11-08 දින මහ සභාවට සහභාගී නොවන බවත්, නිවාඩු අනුමත කර දෙන ලෙසත්, ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා විසින් කරන ලද ඉල්ලීම ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදුව නිවාඩු අනුමත කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය පෙ.ව 10.12 ට පමණ සභාවට පැමිණෙන ලදී.**

**03. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම**

- නිවාස නවයකින් සමන්විත බළන්ගොඩ සිටිගාඩින්හි(දකුණු පස) ප්‍රධාන කාණුව වසර ගණනාවක් තිස්සේ අලුත්වැඩියා කළ යුතුව පවතින අතර, මේ නිසා දුගඳ හැමීම මෙන්ම කාණුව මැද ඇති වලවල්හි ජලය රැඳීම නිසා මදුරුවන් බෝ වී ඩෙංගු වැනි වසංගත තත්ත්වයන්ට මුහුණ දීමට සිදුවීම වැනි ඇති බව ද කාණුව පිළිසකර කර දෙන ලෙසද පවසමින් සිටි ගාඩින් ප්‍රදේශවාසීන් වෙනුවෙන් බළන්ගොඩ, සිටි ගාඩින්, 360/1 කේ, මහාචාර්ය මනෝජ් ආරියරත්න යන අය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  **ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා පෙ.ව 10.13 ට පමණ සභාවට පැමිණෙන ලදී.**

  **ගරු උප සභාපති එම්.ටී.එම්.රුමී මැතිතුමා පෙ.ව 10.14 ට පමණ සභාවට පැමිණෙන ලදී.**
  ගරු සභාපතිතුමා කාණුව පිළිසකර කිරීමේ කටයුතු සිදු කරන ලෙස වැඩ අධිකාරීතුමාට පවසන ලදී.

- රටේ පවතින උද්ධමනය, භාණ්ඩ හා සේවා මිල ගණන් සීඝ්‍ර ලෙස ඉහළ යාම, මහජනතාවට සිදුව ඇති ආර්ථික දුෂ්කරතාව මත පළාත් පාලන ආයතන විසින් දැනට පනවා ඇති වරිපනම් බදු ප්‍රතිශතය 2023-12-31 දක්වා එලෙසම පවත්වාගෙන යාමටත්, වර්තමානයේ රටේ පවතින උද්ධමනය හේතුවෙන් මහජනතාවට සිදුව ඇති ආර්ථික දුෂ්කරතාවය සලකා පළාත් පාලන ආයතන විසින් දැනට සිදු කර ඇති නව දේපල තක්සේරු කිරීම් අනුව වරිපනම් බදු පනවා අය කිරීම 2023-12-31 දක්වා කල් දැමීමට ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බැවින් මේ පිළිබඳව දැනුවත්ව කටයුතු කරන ලෙස දන්වමින් සබරගමු පළාත් පාලන කොමසාරිස් විසින් 2022-10-19 දිනැතිව හා CLG/LG-5/3/1 (111 වෙළුම) දරණ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

- කුඹල්මුල්ලේ කපුරාළලාගේ සිරිසේන යන අයට අයත් බළන්ගොඩ, කිරිඳිගල, ජනපද පාරෙහි වරිපනම් අංක 19 දරණ වත්තේ ගෙදර අරාව නැමැති ඉඩම ආසන්න වන තෙක් බළන්ගොඩ නගර සභාව විසින් කාණු පද්ධතියක් ඉදි කර ඇති අතර, එකී කාණු පද්ධතිය මඟින් වැසි සමයේ ගලා එන ජලය ඉහත සඳහන් ඉඩම තුලින් ගලා යෑමට ලක්වෙන බව ද නගර සභාව විසින් කාණු පද්ධතිය නිසි ආකාරයෙන් සකස් නොකිරීම හේතුවෙන් මෙම ඉඩම සෝදා පාළුවට ලක් ව වගාවන් විනාශ වී ඇති බව ද මේ නිසා රුපියල් ලක්ෂ 15ක පමණ අලාභයක් සිදුව ඇති බව ද මෙම අලාභය සිරිසේන යන අයට ගෙවන ලෙසත්, කාණු පද්ධතිය විධිමත්ව ඉදි කරන ලෙසත් මෙම ඉල්ලීම් පැහැර හරින්නේ නම් අධිකරණයේ නඩු පවරා එකී අලාභ මුදල සහ ජලය බැහැර කිරීම වළක්වන ලෙස ගරු අධිකරණයෙන් නියෝගයක් ලබා ගැනීමටත් සිරිසේන යන අය තමන් හට උපදෙස් ලබා දී ඇති බවත් දන්වමින් නීතිඥ දිනෙත් දයාරත්න මහතා විසින් එවන ලද ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  මේ සම්බන්ධව වැඩ අධිකාරීතුමාගෙන් කරුණු විමසීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

අදාල කරුණු පැහැදිලි කරගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත්කර ගන්නා ලදි.

ඒ අනුව අදාල ස්ථානය වැඩ අධිකාරීතුමා විසින් පරීක්ෂා කර වාර්තාවක් ලබා ගැනීමෙන් අනතුරුව මේ සම්බන්ධව ගත යුතු ක්‍රියාමාර්ග සාකච්ඡා කිරීම සුදුසු බව තීරණය විය.

- මක්කමා (සවුදි අරාබියා) නගරයට ආගමික වන්දනාවක් යාම සඳහා 2022-11-22 දින සිට 2022-12-05 දින දක්වා කාලය වෙනුවෙන් නිවාඩු අනුමත කර දෙන ලෙස බළන්ගොඩ නගර සභාවේ උප සභාපති එම්.ටී.එම්. රුමි මැතිතුමා විසින් කරන ලද ඉල්ලීම් ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදුව නිවාඩු අනුමත කරන ලදී.

- කිරිදිගල ග්‍රාම නිලධාරී බල ප්‍රදේශයේ ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන වැඩසටහනට සමගාමීව ආහාර සුරක්ෂිතතාවය උදා කරලීම සඳහා ගෙවතු වගා 1000 ක් ඇති කරලීමට කටයුතු කර ඇති බැවින් ඔවුන්ට ශක්තියක් වීම සඳහා නොමිලේ පොහොර ලබා දෙන ලෙස ඉල්ලමින් කිරිදිගල ග්‍රාම නිලධාරී වසමේ ග්‍රාම නිලධාරීතුමා විසින් කරන ලද ඉල්ලීම් ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

  ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය පැවසුයේ ගෙවතු වගා 1000 කටම නොව ගෙවතු වගාව උනන්දුවෙන් සිදු කරන කීප දෙනෙකුට කොට්ඨාස මට්ටමින් පොහොර ලබා දීම සුදුසු බවයි.

**ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පෙ.ව 10.21 ට පමණ සභාවට පැමිණෙන ලදී.**

- කසළ ටෙන්ඩරයේ වැඩ රාජකාරී නිසි ලෙස ක්‍රියාත්මක කිරීමට ඉඩ නොලැබෙන පරිදි යම් කිසි පිරිසක් විසින් ක්‍රියා කළ බවත්, කසළ ටෙන්ඩරය නවතන ලෙස තර්ජන එල්ලවන බවත් පවසමින් මේ සම්බන්ධව සොයා බලන ලෙස කසළ ටෙන්ඩර්කරු විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීම් ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

  ගරු සභාපතිතුමා මේ සම්බන්ධව අදහස් දක්වමින් ටෙන්ඩරය ලබා ගත් මුල් දින කිහිපයේ ප්‍රශ්න මතුව පැවතුන අතර, සභාවේ නිළධාරීන් හා ටෙන්ඩර්කරු අදාල කටයුතු පිළිබඳව සාකච්ඡා කළ බවත්, වැටුප් සම්බන්ධ ප්‍රශ්නයක් මතුව තිබුණු බවත් තමන් විසින් දිනපතා අධීක්ෂණයක නියැලෙන අතර මේ වන විට ගැටලු නිරාකරණය කර ගෙන ඇති බවත් පවසන ලදී.

  ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් කසළ ටෙන්ඩර්කරු නියමිත කාලසටහනින් පරිබාහිරව කටයුතු කිරීම නිසා ගැටලු මතුව තිබූ අතර, සේවකයන් අඩුවීමේ තත්ත්වයක් තිබුණු බව ද තමන් සෞඛ්‍ය කමිටු සභාපති වශයෙන් මේ සම්බන්ධව මැදිහත් වී අධීක්ෂණයක නියැලුණු බව ද පැවසීය.

**04. ටෙන්ඩර්පත් හා මිළ ගණන් විවෘත කිරීම.**

04:01 සභාව සතු වාහන 2023 වර්ෂය සඳහා රක්ෂණය කිරීමට අදාලව මිල ගණන් විවෘත කිරීම

මිල ගණන් විවෘත කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාළ මිල ගණන් විවෘත කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමියගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ඒ අනුව ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්, ජාතික රක්ෂණ භාර අරමුදල හා සීමාසහිත සමූපකාර රක්ෂණ සමාගම යන ආයතනයන්ගෙන් මිල ගණන් ඉදිරිපත් වී තිබුණු අතර, 2022-12-24 දින සිට 2023-12-23 දින දක්වා කාලයක් සඳහා හිමිකම් සහ වරප්‍රසාද ඇතුලත්ව වාහන රක්ෂණය කිරීමට අවම මිල ගණන වන රු. 303,160.83 ක මුදල ඉදිරිපත් කළ ජාතික රක්ෂණ භාර අරමුදල වෙතින් අදාල සේවාව ලබා ගැනීම සඳහා ගරු සභාපතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා පෙ.ව 10.47 ට පමණ සභාවට පැමිණෙන ලදී.**

**05. කල් දී ඇති ප්‍රශ්න**

05:01 **ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

05:01:01 සුනන්දාරාම මාවතේ ස්ථාන දෙකක මාර්ගය අවහිර වන සේ ඉදි කර ඇති අනවසර වැට පිළිබඳව දිගින් දිගටම සභාවේ සාකච්ඡා විය. එම වැටවල් ඉවත් කිරීමට ගත් ක්‍රියාමාර්ගය කුමක් ද?

අදාල කරුණු සම්බන්ධව වැඩ අධිකාරීතුමාගෙන් විමසීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාළ කරුණු විමසීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමියගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**06. කල් දී ඇති යෝජනා**

**06:01 ගරු සභාපති ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා**

06:01:01 2023 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කිරීම සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය පත් කිරීමට සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් 2023 වර්ෂය සඳහා බළන්ගොඩ නගර සභාවේ ප්‍රධාන කාර්යාලය,ගබඩාව,නගර සභා පෙර පාසල, ආයුර්වේදය, ක්‍රීඩාගාරය, බැංකියවත්ත කොම්පෝස්ට් ව්‍යාපෘතිය, විදුනැණ පියස, සම්පත් පියස,ලේකම් නිල නිවස, වැවවත්ත හා බෝම්බුව පෙර පාසල, මහජන පුස්තකාලය, කියවීම් ශාලාව යන අංශවලට අදාල වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීම සඳහා පහත නම් සඳහන් සමීක්ෂණ මණ්ඩලය පත් කිරීම සුදුසු බවට යෝජනා කළ අතර, භාණ්ඩ සමීක්ෂණය අධීක්ෂණය සඳහා ගරු මන්ත්‍රීවරුන් දෙදෙනෙකු පත් කර ගන්නා ලෙස පවසන ලදී.

- සභාපති — ප්‍රධාන කළමනාකරණ සේවා නිළධාරි, ජී. ඩී. ඒ. සේමපාල මිය
- සාමාජික — සංවර්ධන නිළධාරී, තක්ෂිලා ප්‍රජාපතී මිය
- සාමාජික — සංවර්ධන නිළධාරී, සුජාතා නීලකාන්ති මිය
- සාමාජික — සංවර්ධන නිළධාරි රසිකා ගුණසේකර මිය
- සාමාජික — කළමනාකරණ සේවා නිළධාරි සජිත් ශානක මයා
- සාමාජික — කළමනාකරණ සේවා නිලධාරී, නදීකා සුභාෂිණී මිය
- සාමාජික — සංවර්ධන නිළධාරී,අනූෂා මල්කාන්ති මිය
- සාමාජික — සංවර්ධන නිළධාරී, මධුෂානි ආනන්ද මිය
- සාමාජික — කළමනාකරණ සේවා නිළධාරි , ඩබ්. එස්. මෙනේරිවත්ත මිය
- සාමාජික — සංවර්ධන නිළධාරි දීපා ප්‍රභාෂිණී රණසිංහ මිය
- සාමාජික — සංවර්ධන නිළධාරි හේමාලී සජීවනී මිය
- සාමාජික — කළමනාකරණ සේවා නිලධාරී, චිත්‍රා නිශාන්ති මිය
- සාමාජික — පුස්තකාලායාධිපති හා පුස්තකාල කාර්යය මණ්ඩලය
- අධීක්ෂණය — ගණකාධිකාරි, එම්. ඩී. එස්. ප්‍රනාන්දු මයා

ඒ අනුව ඉහත නම් සඳහන් සමීක්ෂණ මණ්ඩලය පත් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා ස්ථිර කරන ලදී.

භාණ්ඩ සමීක්ෂණය අධීක්ෂණය සඳහා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා සහ ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා සුදුසු බව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා යෝජනා කළ අතර, ගරු නාගරික මන්ත්‍රී ජී. චන්ද්‍රලතා මැතිතුමිය ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:02 බළන්ගොඩ නගර මධ්‍යයේ ඔරලෝසු කණුව හා ඒ ආශ්‍රිත වටරවුම අලංකරණය කිරීම සඳහා හිල්බර්න් ජාත්‍යන්තර පාසල අනුග්‍රහය දැක්වීමට අපේක්ෂා කරන බැවින් ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා පැවසූයේ මේ වන විට නිපොලැක් ආයතනය විසින් මොහාන් සාලිය එල්ලාවල මාවතේ මල්පෝච්චි අලංකාරව වර්ණ ගන්වා ඇති බැවින් බළන්ගොඩ නගර මධ්‍යයේ ඔරලෝසු කණුව හා ඒ ආශ්‍රිත වටරවුම අලංකරණය කිරීමේ කාර්යය එම ආයතනයටම ලබා දීම සුදුසු වන බවයි.

ඒ අනුව එම කාර්යය හිල්බර්න් ජාත්‍යන්තර පාසල සඳහා ලබා දීමේ යෝජනාව ප්‍රතික්ෂේප විය.

06:01:03 2023 වර්ෂයට ගාස්තු සංශෝධනය කර ඇති බැවින් පෞද්ගලික බස් ගාල් ගාස්තු අය කිරීම වෙනුවෙන් සුදුසු බදුකරුවන් තෝරා ගැනීම සඳහා ටෙන්ඩර් කිරීමේ දී වැඩි කර ඇති ප්‍රතිශතයන් සලකා බලා අවම ලංසු මුදල තීරණය කිරීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් 2022-10-11 දිනැති මහ සභාවේ අංක 06:01:03 යටතේ පෞද්ගලික බස් ගාල් ගාස්තු අය කිරීම වෙනුවෙන් සුදුසු බදුකරුවන් තෝරා ගැනීම සඳහා ටෙන්ඩර් කිරීමටත් අවම ලංසු මුදල රු. 95,050.00 ක් බවටත් තීරණය වූ නමුත් ලොරියක්, බස් රථයක් හෝ වෙනයම් වාහනයක් සඳහා 2022 වර්ෂයේ පැවති රු.50.00 ක ගාස්තුව 2023 වර්ෂයට රු. 100.00 ක් වශයෙන් 100% ක් සංශෝධනය කර ඇති බවද එම නිසා ගාස්තු සංශෝධනය සම්බන්ධව සලකා බලා අවම ලංසු මුදල තීරණය කළ යුතු බව ද පවසන ලදී.

මේ සම්බන්ධව ලේකම්තුමාගෙන් කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදි.

අදාල කරුණු පැහැදිලි කරගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත්කර ගන්නා ලදි.

ඒ අනුව 2023-01-01 වන දින සිට 2023-12-31 දින දක්වා වූ කාලයක් සඳහා පෞද්ගලික බස් ගාල් ගාස්තු අය කිරීමේ වර්තමාන මාසික ටෙන්ඩර් මුදල වන රු.95,050.00 ක මුදලට 50% ක් වැඩි කර එනම්, රු.142,575.00 ක මුදල අවම මාසික ලංසු මුදල වශයෙන් ගෙන ටෙන්ඩර් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:04 2023 වර්ෂයට ගාස්තු සංශෝධනය කර ඇති බැවින් රථවාහන නැවතුම් ගාස්තු අය කිරීම වෙනුවෙන් සුදුසු බදුකරුවන් තෝරා ගැනීම සඳහා ටෙන්ඩර් කිරීමේ දී වැඩි කර ඇති ප්‍රතිශතයන් සලකා බලා අවම ලංසු මුදල තීරණය කිරීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් 2022-10-11 දිනැති මහ සභාවේ අංක 06:01:04 යටතේ රථවාහන නැවතුම් ගාස්තු අය කිරීම වෙනුවෙන් සුදුසු බදුකරුවන් තෝරා ගැනීම සඳහා ටෙන්ඩර් කිරීමටත් අවම ලංසු මුදල රු. 100,150.00 ක් බවටත් තීරණය වූ නමුත් වෑන් රථයක්, ජීප් රථයක් සඳහා 25% ක්, මෝටර් රථයක්/මෝටර් කාර් රථයක් සඳහා 66%ක් හා ත්‍රී රෝද රථයක් සඳහා 50% ක් වශයෙන් 2023 වර්ෂයට අදාලව ගාස්තු සංශෝධනය කර ඇති බව ද එම නිසා ගාස්තු සංශෝධනය සම්බන්ධව සලකා බලා අවම ලංසු මුදල තීරණය කළ යුතු බව ද පවසන ලදී.

ඒ අනුව 2023-01-01 වන දින සිට 2023-12-31 දින දක්වා වූ කාලයක් සඳහා රථවාහන නැවතුම් ගාස්තු අය කිරීමේ වර්තමාන මාසික ටෙන්ඩර් මුදල වන රු.100,150.00 ක මුදලට 20% ක් වැඩි කර එනම්, රු.120,180.00 ක මුදල අවම මාසික ලංසු මුදල වශයෙන් ගෙන ටෙන්ඩර් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:05 බළන්ගොඩ නගර සභාව සතු ඉරිදා සතිපොළ ටෙන්ඩර් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් බළන්ගොඩ නගර සභාව සතු ඉරිදා සතිපොළ පොළ මඩු 311 න් 21 ක් වාර්ෂික ගිවිසුම්ගතව මාසික කුලී පදනම මත ලබා දී ඇති අතර, ඉතිරි පොළ මඩු 290 සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් 2018-06-20 දිනැති අංක RT/RP/1492 දරණ ලිපියෙහි සඳහන් තක්සේරුව අනුව ඉරිදා දිනවල දී එක් කුටියකින් රු.250.00 බැගින් අය කරන බව ද පොළ මඩු 290න් 125කට ආසන්න ප්‍රමාණයක් සෑම ඉරිදා දිනකම හිස්ව පැවතීම හේතුවෙන් නගර සභාව වෙත අයවීමට ඇති විශාල ආදායමක් අහිමි වී ඇති බව ද ඉරිදා දින හතරක් සහිත සෑම මසකම ලක්ෂ 03 ක් ඉක්ම වූ ආදායමක් ලැබිය යුතු වුවත් එවැනි ආදායමක් අය නොවන බව ද ඉරිදා සතිපොළ ටෙන්ඩර් කරන්නේ නම් සතිපතා නගර සභාව වෙත  ස්ථිර ආදායමක් ලැබෙන අතර, සභාවේ ආදායම ඉහළ යන බව ද පවසන ලදී.

2018 වර්ෂයේ දී අවසාන වරට ටෙන්ඩර් කර ඇති අතර, සතියකට බදු මුදල රු. 73,000.00 ක් වූ බව ද වැඩිදුරටත් ගරු සභාපතිතුමා පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් ප්‍රවාහන ගාස්තු වැඩි වීම හා ස්ථාන කිහිපයක පොළ පැවැත්වීම නිසා ඉරිදා පොළ වෙත පැමිණෙන වෙළෙන්දන් අඩු වී ඇති අතර, ටෙන්ඩර් කිරීම නිසා වෙළෙන්දන්ට හා පාරිභෝගිකයන්ට අසාධාරණයක් වන බැවින් සභාව විසින් කරගෙන යාම සුදුසු බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා පැවසූයේ එක් පැත්තක වාහන නවත්වා ඇති බැවින් එම ස්ථානයට ප්‍රවේශ වීමේ අපහසුතාවය නිසා වෙළඳාම් කටයුතු එම කොටසෙහි සිදු නොවන බවයි.

මේ සම්බන්ධව ඇති වූ සාකච්ඡාවෙන් පසුව බළන්ගොඩ නගර සභාව සතු ඉරිදා සතිපොළ ටෙන්ඩර් කිරීමේ යෝජනාව ප්‍රතික්ෂේප විය.

06:01:06 පොදු වෙළඳසැල අංක 09 හා 10 මාළු කඩ හැර අනෙක් මාළු කඩ කාමර ටෙන්ඩර් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පළාත් පාලන කොමසාරිස්ගේ අංක 03/2020 චක්‍රලේඛය අනුව පළාත් පාලන ආයතනවල සියළුම මස් හා මාළු කඩ වාර්ෂිකව ටෙන්ඩර් කිරීම මඟින් බදු දීමට පියවර ගත යුතු අතර, ටෙන්ඩර් නොකිරීම විගණිත කරුණක් වී ඇති බව ද රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් පහත පරිදි මාළු කඩ තක්සේරු කර ඇති බව ද පවසන ලදී.

| | | | |
|---|---|---|---|
| i. | 11 මාළු කඩ කාමරය | - | රු. 10,000.00 |
| ii. | 12 මාළු කඩ කාමරය | - | රු. 10,000.00 |
| iii. | 14 මාළු කඩ කාමරය | - | රු. 10,000.00 |
| iv. | 18 මාළු කඩ කාමරය | - | රු. 21,000.00 |

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් පොදු වෙළඳසැල අංක 09,10 හා 18 යන කඩවල පමණක් ව්‍යාපාර කටයුතු කරන අතර, අවුරුදු 20ක් 25 ක් පමණ වෙළඳාම් කටයුතු කරන රං මහත්තයා යන රෝගී තත්ත්වයෙන් පසුවන බව ද නඩුව අවසන් වූ පසු සියලුම මාළු කඩ ටෙන්ඩර් කිරීම කළ හැකි බැවින් ඒ වන තෙක් ටෙන්ඩර් නොකරන ලෙසද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා පැවසුයේ මාළු කඩ ටෙන්ඩර් කිරීම මත දීර්ඝ කාලයක් ව්‍යාපාරය කළ අය අසරණතාවයට පත් වන බැවින් ටෙන්ඩර් නොකිරීම සුදුසු බවයි.

ගරු සභාපතිතුමා නැවත අදහස් දක්වමින් මාළු කඩ ටෙන්ඩර් නොකිරීමේ වගකීම සභාව විසින් ගත යුතු අතර, තමන් සභාපති වශයෙන් ටෙන්ඩර් කිරීමට යෝජනා කරන බව පැවසීය.

මේ සම්බන්ධව අදහස් දෙකක් ඉදිරිපත් වීම නිසා ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් පොදු වෙළඳසැල අංක 09 හා 10 මාළු කඩ හැර අනෙක් මාළු කඩ කාමර ටෙන්ඩර් කිරීමේ යෝජනාවට පක්ෂ බව හා විපක්ෂ බව විමසීම සඳහා බෙදීමක් යෝජනා කරන ලදුව එම යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමී මැතිතුමා ස්ථිර කරන ලදී.

ඒ සඳහා අවශ්‍ය වන්නේ විවෘත ඡන්දයක්ද, රහස් ඡන්දයක්ද යන්න යෝජනා ස්ථිර කර ගන්නා ලෙස ගරු සභාපතිතුමන් විසින් ගරු සභාව වෙත දැනුම් දෙන ලදී.

එහි දී විවෘත ඡන්දයකට යාම සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රි ලාල් ගලප්පත්ති මැතිතුමා ස්ථිර කරන ලදී.

මෙහිදී, එම යෝජනාවට පක්ෂව සභිකයින් හය දෙනෙකු ද එනම්,

| | |
|---|---|
| 1. ගරු සභාපති | ඩබ්.ඒ. වසන්ත ගුණරත්න මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රිනී | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ලාල් ගලප්පත්ති මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | කේ.ජී. පේමදාස මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එස්.ඒ.ජෝර්ජ් මැතිතුමාද |

විපක්ෂව සභිකවරුන් පස් දෙනෙකුද එනම්,

| | |
|---|---|
| 1. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රී | ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | නිමල් කරුණාරත්න මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | එම්.ඩබ්. විමලසිරි මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රිනී | තරංගනී සමරසේකර මැතිතුමියද |

ඡන්දය ප්‍රකාශ කළ අතර, ඡන්දය ලබා දීමෙන් වැළකී සිටි සභිකවරුන් පස් දෙනෙකුද එනම්,

| | |
|---|---|
| 1. ගරු උප සභාපති | එම්.ටී.එම්. රුමි මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රිනී | සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය |
| 4. ගරු නාගරික මන්ත්‍රිනී | මංගලිකා ඉලංකෝන් මැතිතුමිය |
| 5. ගරු නාගරික මන්ත්‍රිනී | එම්. ශාන්තිලේඛා මැතිතුමියද වේ. |

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා අද දින සභාවට නොපැමිණිනි.

ඒ අනුව පොදු වෙළඳසැල අංක 09 හා 10 මාළු කඩ හැර අනෙක් මාළු කඩ කාමර ටෙන්ඩර් කිරීමේ යෝජනාව පක්ෂව ඡන්ද 06ක් ද, විපක්ෂව ඡන්ද 05 ක් ද වශයෙන් වැඩි ඡන්ද 01 කින් සභා සම්මත විය.

මෙහි දී රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් මාළු කඩ තක්සේරු කර ඇති මුදල එනම්,

| | | | |
|---|---|---|---|
| i. | 11 මාළු කඩ කාමරය | - | රු. 10,000.00 |
| ii. | 12 මාළු කඩ කාමරය | - | රු. 10,000.00 |
| iii. | 14 මාළු කඩ කාමරය | - | රු. 10,000.00 |
| iv. | 18 මාළු කඩ කාමරය | - | රු. 21,000.00 |

මාසික අවම ලංසු මුදල වශයෙන් ගෙන විවෘත ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කරමින් ටෙන්ඩර් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:07 2023 වර්ෂය වෙනුවෙන් සභාව සතු කඩ කාමරවල සහ දේපල ගිවිසුම් කෙටුම්පත් සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

i. පදික කඩ
ii. විවෘත කඩ
iii. මැණික් කඩ
iv. සාප්පු කඩ
v. සභාව සතු දේපල
vi. පොදු වෙළඳසැල එළවළු කඩ
vii. නව පදික කඩ
viii. පොළ කඩ
ix. මහජන පොළ කඩ
x. පොළ ගබඩා
xi. මහජන පොල ආපන ශාලාව
xii. සම්පත් පියසට යාබද කඩ කාමරය
xiii. විද්‍යුත් නාම පුවරු
xiv. ටෙන්ඩර් දැන්වීම් පුවරු
xv. බස් නැවතුම්පොල කඩ කාමර හා කාර්යාල කාමර

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:08 2022 සැප්තැම්බර් 23 සිට ඔක්තෝම්බර් 02 දක්වා කාලය තුල බළන්ගොඩ නගර සභා ක්‍රීඩාංගනයේ පවත්වන ලද සංගීත සැණකෙලිය වෙනුවෙන් තැන්පත් කළ රුපියල් ලක්ෂ 25 ක මුදල නිදහස් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් 2022-09-23 දින සිට 2022-10-02 දක්වා වූ කාල වකවානුව තුල පැවැත්වූ සංගීත සැණකෙලිය නිසා නගර සභා ක්‍රීඩා පිටියට සිදු වූ අලාභ හානිය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා 2022-10-03 වන දින දැල විදානලාගේ සුජිත ශිරාන් දැල යන අය සමඟ ගිවිසුම් ගත වූ බව ද,

ගිවිසුම් ගත කොන්දේසි,

- ක්‍රීඩා පිටියේ ඇති සියළු රොන් මඩ කොටස් සහ ඔබ විසින් පුරවා ඇති කොටස් ඉවත් කිරීම කළ යුතුය.
- සුදුසු ග්‍රැවල් පස් (Approved Soil) යොදා සුදුසු පරිදි මට්ටම් කිරීමෙන් අනතුරුව විධිමත් පරිදි සනවත් කළ යුතුය.(Rolling)
- මට්ටම් කිරීමෙන් අනතුරව තෘණ පිඩලි යොදා යථා පරිදි සම්පූර්ණ අලාභ හානි වූ ක්‍රීඩා පිටිය සකස් කර දිය යුතුය.

ඉහත ගිවිසුම්ගත කොන්දේසිවලට අනුව ගිවිසුම්කරු විසින් ක්‍රීඩා පිටිය යථාවත් කර ඇති බව වැඩ අධිකාරී තාක්ෂණික වාර්තාව මගින් දක්වා ඇති බවද පවසන ලදී. එනම්,

- ක්‍රීඩා පිටියේ තිබූ සියළු රොන් මඩ කොටස් සහ ගිවිසුම්කරු විසින් පුරවා තිබූ කොටස් ඉවත් කර ඇත.
- ග්‍රැවල් පස් යොදා මෝටර් ග්‍රේඩරය යොදා මට්ටම් කර රෝල යොදා සනවත් කර ඇත.

නමුත් ක්‍රීඩා පිටියේ භෞතික නිරීක්ෂණ අනුව පවතින වැසි තත්ත්වය හේතුවෙන් පස් යොදා තවදුරටත් මට්ටම් කළ යුතු කොටස් මට්ටම් කිරීම හා රෝල යොදා සනවත් කිරීම කළ නොහැකි බැවින් වියළි කාලගුණ තත්ත්වයක් යටතේ එම කාර්යය කිරීම සුදුසු බවට එම වැඩ අධිකාරී වාර්තාවේ නිර්දේශ කර ඇති බව ද පිට්ටනියේ තණකොළ වැවෙමින් පවතින අතර ස්ථාන කිහිපයක වල ගොඩැලි තත්ත්වයක් පවතින බව ද එය ග්‍රැවල් පස් යොදා මට්ටම් කිරීම කර සම්පූර්ණ ක්‍රීඩා පිටිය තුල රෝල යොදා සනවත් කිරීම කළ යුතු බව එම වාර්තාව මඟින් තවදුරටත් පෙන්වා දී ඇති බව ද එකී නිර්දේශය සභාවේ ගරු නාගරික මන්ත්‍රී/මන්ත්‍රීවරියන් සියලුම දෙනා විසින් සාකච්ඡා කර තැන්පත් මුදල නිදහස් කිරීම සම්බන්ධව තීරණයක් ගෙන එම තීරණය සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බව ද ගරු සභාපතිතුමා පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් ක්‍රීඩා පිටිය තවමත් යථා තත්ත්වයට පත්ව නොමැති බවත්, පිට්ටනිය වටා තිබූ කාණුව වැසී පවතින නිසා වැසි ජලය රැඳෙන බවත්, පිට්ටනියට පිටතින් පැමිණ කාණුව සකස් කිරීමට හැකි බවත් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසූයේ ක්‍රීඩා පිටිය පැවති තත්ත්වයට වඩා හොඳ තත්ත්වයක පවතින බවයි.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් ක්‍රීඩා පිට්ටනිය වටා කාණුව අනිවාර්යයෙයන්ම සකස් කළ යුතු අතර, ක්‍රීඩා පිටිය පැවති තත්ත්වයටම ගෙන ඒමට එය අත්‍යවශ්‍ය බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය පැවසූයේ ක්‍රීඩා පිටිය සඳහා කාණුව සකස් කිරීම කළ යුතු බවයි.

මේ සම්බන්ධව පැවති සාකච්ඡාවෙන් අනතුරුව 2022 සැප්තැම්බර් 23 සිට ඔක්තෝම්බර් 02 දක්වා කාලය තුල බළන්ගොඩ නගර සභා ක්‍රීඩාංගනයේ පවත්වන ලද සංගීත සැණකෙලිය වෙනුවෙන් තැන්පත් කළ රුපියල් ලක්ෂ 25 ක මුදලින් රුපියල් ලක්ෂ 20 ක මුදල නිදහස් කිරීමටත් පිට්ටනියේ ස්ථාන කිහිපයක වල ගොඩැලි තත්ත්වයක් පවතින අතර, ග්‍රැවල් පස් යොදා මට්ටම් කර සම්පූර්ණ ක්‍රීඩා පිටිය තුල රෝල යොදා සනවත් කිරීම සිදු කිරීමෙන් අනතුරුව ඉතිරි රුපියල් ලක්ෂ 05 ක මුදල සභා අනුමැතිය මත නිදහස් කිරීම සුදුසු බවටත් ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත සංශෝධිත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:09 බෝගහහේන ඉඩම (බුලත්ගම සුසාන භූමි) හා හපුගහහේන ඉඩම (පල්ලෙකුඹුර සුසාන භූමි) නගර සභාව වෙත පවරා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් කුමාරගම ග්‍රාම නිලධාරී වසමේ අංක 620071 කැඩැස්තර සිතියමේ කලාප 12 හි කැබලි අංක 131 වන හපුගහහේන ඉඩම (පල්ලෙකුඹුර සුසාන භූමි) සහ තුඹගොඩ ග්‍රාම නිලධාරී වසමේ අංක 620077 දරණ කැඩැස්තර සිතියමේ කලාප 08 හි කැබලි අංක 118 වන

බෝගහහේන ඉඩම (බුලත්ගම සුසාන භූමි) යන ඉඩම් කොටස් නගර සභාව වෙත පවරා ගත යුතු බව පවසන ලදී.

මේ සම්බන්ධව විෂය නිලධාරීගෙන් කරුණු විමසා බැලීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදි.

අදාල කරුණු පැහැදිලි කරගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත්කර ගන්නා ලදි.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:10 බස් නැවතුම්පළ පිවිසුම් මාර්ගයේ ලංකා බැංකුව ඉදිරිපිට ඇති කඩ පෙළෙහි පිටුපස බිත්තිය වැසි දිනවල තෙත්වීම නිසා වෙළඳාම් කටයුතුවලට අලාභහානි වන බැවින් වැසි ජලය බැස යාමට බැම්ම හා කාණු පද්ධතියක් සකසා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් බස් නැවතුම්පළ පිවිසුම් මාර්ගයේ ලංකා බැංකුව ඉදිරිපිට ඇති කඩ පෙළෙහි පිටුපස බිත්තිය වැසි දිනවල තෙත්වීම නිසා වෙළඳාම් කටයුතුවලට අලාභහානි සිදු වන බැවින් වැසි ජලය බැස යාමට කාණුවක් හා බැම්මක් සකසා දෙන ලෙස එම කඩ හිමියන් විසින් ඉල්ලීමක් කර ඇති බව ද වැසි ජලය නිසා විදුලිය කාන්දු වීමේ ගැටලුවක් පවතින බව ද කාණුව සකස් කිරීම සඳහා සභාවේ මුදල් නොමැති නමුත් ඇස්තමේන්තුවක් සකස් කර දීමේ හැකියාවක් පවතින බව ද පවසන ලදී.

ඒ අනුව බස් නැවතුම්පළ පිවිසුම් මාර්ගයේ ලංකා බැංකුව ඉදිරිපිට ඇති කඩ පෙළෙහි පිටුපස බිත්තිය වැසි දිනවල තෙත්වීම නිසා වෙළඳාම් කටයුතුවලට අලාභහානි වන බැවින් වැසි ජලය බැස යාමට කාණු පද්ධතියක් හා බැම්මක් ඉදිකිරීම සඳහා වන ඇස්තමේන්තුව පමණක් බළන්ගොඩ නගර සභාව විසින් සකස් කර දීමටත් නගර සභාවේ අධීක්ෂණය යටතේ කඩ හිමියන් විසින් කාණුව ඉදි කර ගැනීම සුදුසු බවටත් ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:11 2021 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම වෙනුවෙන් ජාතික විගණන කාර්යාලය වෙත ගෙවිය යුතු විගණන ගාස්තුව වන රු. 511,400.00 ක මුදල ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:12 පහත සඳහන් ගබඩා අවශ්‍යතා සපුරා ගැනීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම

- 30 w CFL බල්බ් - 200
- ස්කු හෝල්ඩර් (සෙරමික්) - 200
- SL ෆිටින් සෙට් - 25
- තම්ලර් ස්විච් - 60
- කන්ට්‍රැක්ටර් (32 ඒ) - 12
- 1/044 වයර් - 10
- සෙලෝටේප් - 24
- Photo shed - 06

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:13 ජීවිත හා දේපලවලට අනතුරුදායකව පැවැති ගස් කැපීම වෙනුවෙන් ඩබ්.චන්ද්‍රපාල හා ඩබ්.සෝමපාල යන අයගෙන් අය කර ගැනීමට ඇති රු.53,350.00 ක මුදල අය නොකිරීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් හිටපු ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ පාලන කාලයේ දී ජීවිත හා දේපලවලට අනතුරුදායකව පැවති මහෝගනී, රුක් අත්තන ගසක්, කොස් ගසක් හා කැන්ද ගසක් 2021-12-03 වන දින බළන්ගොඩ නගර සභාව විසින් කපා දැමූ අතර, ඒ වෙනුවෙන් රු.53,350.00 ක මුදලක් ඩබ්.චන්ද්‍රපාල හා ඩබ්.සෝමපාල යන අයගෙන් අය කර ගැනීමට සිදු වන නමුත් මෙම ගස් පැවති ඉඩම නොබෙදූ ඉඩමක් වන අතර, ඉඩමේ මායිමේ පිහිටා තිබූ බව ද ඉඩමේ අනෙකුත් පාර්ශවකරුවන්ගෙන් අය කර ගැනීමක් සිදු නොකර ඩබ්.චන්ද්‍රපාල හා ඩබ්.සෝමපාල යන අයගෙන් පමණක් අය කර ගැනීම අසාධාරණ බැවින් සාධාරණ තීරණයක් ගැනීම සුදුසු බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා පැවසූයේ මෙම ඉඩම නොබෙදූ ඉඩමක් වන අතර, දෙදෙනෙකුගෙන් පමණක් අය කර ගැනීම අසාධාරණ බවයි.

ගරු සභාපතිතුමා නැවත වරක් අදහස් දක්වමින් නගර සභා ආඥා පනතේ 127 ඉ.(2) 1 වන උප වගන්තිය යටතේ කටයුතු කර ඒ සඳහා සභාව විසින් දරන ලද සියළු වියදම් අදාල පාර්ශවයෙන් අය කර ගැනීමට නීතිමය පියවර ගැනීමට සිදු වන බව ද එසේ වුවහොත් නඩු ගාස්තු ඇතුළු විශාල මුදලක් ආයතනය විසින් දැරීමට සිදු වන බවද මෙම මුදල ගෙවීමට නොහැකි බව හා ආර්ථික දුෂ්කරතාවයෙන් පෙළෙන බවට අදාල පුද්ගලයන් තමන් හට දැනුම් දී ඇති බව ද පවසන ලදී.

ඒ අනුව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව ජීවිත හා දේපලවලට අනතුරුදායකව පැවැති ගස් කැපීම වෙනුවෙන් ඩබ්.චන්ද්‍රපාල හා ඩබ්.සෝමපාල යන අයගෙන් අය කර ගැනීමට ඇති

රු.53,350.00 ක මුදල අය නොකිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:14 ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශයෙන් 2021 වර්ෂයේ ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන සඳහා ප්‍රතිපාදන වෙන් කරන ලද ව්‍යාපෘති 08 ක් සඳහා 2021 දෙසැම්බර් මස බිල්පත් අමාත්‍යාංශයට යොමු කරන ලද අතර, ඒ සඳහා වන මුදල් මෙතෙක් ලැබී නැත. එම මුදල් ලැබෙන තෙක් ප්‍රජා පාදක සංවිධාන සඳහා ගෙවීමට ඇති මුදල් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව සභා අරමුදලින් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:15 123 ඒ දරණ වරිපනම් බදු ගෙවන ගොඩනැගිල්ලේ පහත මාලයේ පවතින 123 බී දරණ රෙදි සාප්පුව වෙනුවෙන් වෙනම වරිපනම් අයකිරීම හෝ වරිපනම් බදු නිදහස් කිරීම සම්බන්ධයෙන් තීරණයක් ගැනීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් වරිපනම් අංක 123 බී දරණ දේපල සඳහා අවසන් වරට බදු ගෙවා ඇත්තේ 2018-01-30 වන අතර, වර්තමානය වන විට රු.11,090.30 ක හිඟ මුදලක් පවතින බව ද රෙදි සාප්පුවක් ලෙස ලේඛනගත වී ඇති නමුත් අවුරුදු පහක පමණ කාලයක සිට වසා දමා ඇති බව ද පවසන ලදී.

මේ සම්බන්ධව ලේකම්තුමාගෙන් කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදි.

අදාල කරුණු පැහැදිලි කරගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. ප්‍රේමදාස මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත්කර ගන්නා ලදී.

ඒ අනුව වරිපනම් අංක 123 බී දරණ රෙදි සාප්පුව අවුරුදු පහක පමණ කාලයක සිට වසා දමා ඇති බැවින් වසා ඇති කාල සීමාවට අදාලව පමණක් වාර්ෂිකව අය විය යුතු හිඟ වරිපනම් කපා හැරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:16 2021 වර්ෂයේ රථවාහන නැවතුම් ගාස්තු අයකිරීමේ ටෙන්ඩරය සහ පෞද්ගලික බස් ගාල් ගාස්තු අය කිරීමේ ටෙන්ඩරයට අදාල අය කල යුතු ආදායම් කපා හැරීමේ සභා තීරණය සංශෝධනය කර ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් 2022-08-19 දිනැති විශේෂ මහ සභාවේ අංක 03 සහ 2022-09-13 දිනැති මහ සභාවේ අංක 06:01:13 යටතේ ලබා ගත් සභා තීරණවල ආදායම් කපා හැරීම යන අදහස ඇතුලත්ව නොමැති බැවින් එම සභා තීරණය සංශෝධනය කිරීම සඳහා මෙම යෝජනාව ඉදිරිපත් කරන බව පවසන ලදී.

එමෙන්ම 2021 වර්ෂයේ කොරෝනා වසංගතය හේතුවෙන් රටේ ආර්ථිකයට කල බලපෑම් වර්තමානය වන විට ද ඇති බැවින් 2021 වර්ෂයේ රථවාහන නැවතුම් ගාස්තු අය කිරීමේ හා පෞද්ගලික බස් ගාල් ගාස්තු අය කිරීමේ ටෙන්ඩර් ලබා ගත් අය විසින් නගර සභාවට ගෙවිය යුතුව ඇති ගෙවීම් කිරීමට තම ආදායම් ප්‍රමාණවත් නොවන බැවින් ඒ සඳහා සහනයක් ලබා දෙන ලෙස වරින්වර ඉල්ලීම් කර ඇති බව ද එම ලැබිය යුතු ආදායම් අය කර ගැනීම සඳහා එම අය සමග අවස්ථා කීපයක දීම සාකච්ඡා කල අතර, ලිපි මගින් දැනුම් දීම් සිදු කළ නමුත් කොරෝනා වසංගතය හේතුවෙන් ගාස්තු අය කිරීමට නොහැකි වූ බව ද වර්තමානය වන විට රැකියා අහිමි වීම නිසා ප්‍රමාණවත් ආදායමක් නොමැති බැවින් එම හිග මුදල් ගෙවීමෙන් නිදහස් කරන ලෙස ටෙන්ඩර් ලබා ගත් අය ඉල්ලා ඇති බව ද වැඩිදුරටත් පැවසීය.

ඒ අනුව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව පෞද්ගලික බස් ගාල් ගාස්තු රු. 221,100.00 ක් හා රථවාහන නැවතුම් ගාස්තු රු. 434,980.00 ක් වශයෙන් මුළු මුදල වන රු. 656,080.00 ක මුදල අය නොකර කපා හැරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් කළ සංශෝධිත යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත සංශෝධිත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07. මන්ත්‍රී යෝජනා**

07:01 **ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

07:01:01 බස්නැවතුම්පළ පිරිමි වැසිකිලිය පිටුපස රාස්සගල පාර බස් නැවතුමේ ඇති අනාරක්ෂිත විදුලි කණුව අලුත්වැඩියා කිරීම

07:01:02 බස් නැවතුම්පළ දකුණු පස ගොඩනැගිල්ලේ ඉහළ මාලයේ (මංගල ටේලර්ස් ආයතනයට) යාබද හිස් බිමේ විශාල වශයෙන් අපචාර සහ සමාජ විරෝධී ක්‍රියා සිදු වන බවට විශාල පැමිණිලි ප්‍රමාණයක් ලැබී ඇත. එම නිසා එම හිස් ඉඩකඩෙහි කඩ කාමරයක් ඉදි කර ක්‍රමවත් ටෙන්ඩර් පටිපාටියකින් තෝරා ගත් බදු කරුවෙකුට ලබා දීම හෝ එම බිම් කොටස කඩ කාමරයක් ඉදි කිරීම සඳහා ටෙන්ඩර් කිරීම

07:01:03 මොහාන් එල්ලාවල මාවතේ ඇති මල් පෝච්චිවල අඳුරු වර්ණයක් ආලේප කිරීම හේතුවෙන් රාත්‍රී කාලයේ දී රථවාහන ධාවනය කරන රියදුරන්ට එම මල් පෝච්චි පැහැදිලිව දර්ශනය නොවීම

හේතුවෙන් රිය අනතුරු සිදු වීමේ අවදානමක් ඇත. එයට පිළියමක් ලෙස මල් පෝච්චිවල මාර්ගයට විවෘත වන දෙකොනේ රේඩියම් ස්ටිකරයක් ඇලවීම හෝ වර්ණයක් ආලේප කිරීම

ඉහත සඳහන් යෝජනා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

07:02 **ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. ජේමදාස මැතිතුමා**

07:02:01 තුඹගොඩ බුද්ධ ජයන්ති මාවතේ ජල ටැංකිය අසලින් කන්දෙ විහාරයට යන පාරේ දෙපස කාණු පද්ධතිය වල් බිහි වී පස් කඩා වැටී අබලන්ව ඇත. මෙම කොටස යථා තත්ත්වයට පත් කර ගැනීම සඳහා ජේසීබී යන්ත්‍රය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී එම්.ශාන්තිලේඛා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

07:03 **ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය**

07:03:01 ක්‍රීඩාංගන භූමියේ ඇති ළමා උද්‍යානයේ ඇති ක්‍රීඩා භාණ්ඩ ප්‍රමාණයන් අක්‍රිය බැවින් එම භාණ්ඩ අලුත්වැඩියා කර ගැනීම

ඉහත සඳහන් යෝජනා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08. කාරක සභා වාර්තා, කමිටු වාර්තා සළකා බැලීම.**

**08:01 2022-11-04 දිනැති කර්මාන්ත කමිටු වාර්තාව**

02. සංවර්ධන කටයුතු සඳහා ලබා දෙන මන්ත්‍රී යෝජනා වෙනුවෙන් නිර්දේශ ලබා දීම

3:01 ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා - 03:01:01 සිට 03:01:03 දක්වා වූ යෝජනා

3:02 ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා - 03:02:01 සිට 03:02:05 දක්වා වූ යෝජනා

3:03 ගරු නාගරික මන්ත්‍රීනී අයි.ඒ. ඉලංකෝන් මැතිතුමිය - 03:03:01 යෝජනා

3:04 ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය - 03:04:01 සිට 03:04:03 දක්වා වූ යෝජනා

3:05 ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා - 03:05:01 සිට 03:05:06 දක්වා වූ යෝජනා

3:06 ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා - 03:06:01 සිට 03:06:02 දක්වා වූ යෝජනා

3:07 ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා - 03:07:01 සිට 03:07:02 දක්වා වූ යෝජනා

3:08 ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා - 03:08:01 සිට 03:08:02 දක්වා වූ යෝජනා

3:09 ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා - 03:09:01 සිට 03:09:02 දක්වා වූ යෝජනා

3:10 ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය - 03:10:01 යෝජනා

04. විශේෂ කරුණු

- සභාපති අරමුදල යටතේ අඩු ආදායම්ලාභී පවුලක් සඳහා වැසිකිළි ආධාර ලබා දීම වෙනුවෙන් ගරු නාගරික මන්ත්‍රී එස්.ජ්.ජෝර්ජ් මැතිතුමා වෙත රු. 25,000.00 ක මුදලක් ලබා දීම

ඉහත සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා යන්ත්‍ර, සේවකයන් හා රථ වාහන ලබා ගැනීම සඳහාත් 2022 නොවැම්බර් මස කර්මාන්ත අංශය මඟින් සිදු කිරීමට අපේක්ෂිත කර්මාන්ත හා නඩත්තු කටයුතු සිදු කිරීම සඳහාත් නිර්දේශ ලබා දීම

**08:02 2022-09-16 දිනැති මුදල් කමිටු වාර්තාව**

01. තුරු උයන හෝජනාගාරය ඉදිකිරීමේ වාස්තු විද්‍යාඥ සැලසුම් සකස් කර ඇති බැවින් ඒ සඳහා අදාළ ගෙවීම් සිදු කිරීම.

- 1St payment - **Preliminary sketches** Include out – line proposal,

  (Rs.100,000/=)

- 2nd payment - For **Design development**

  Lay – out plans,3Ds Images,3D video Floor – Area, Design Developments and Finalized schematic sketch scheme

  (Rs.250,000/=)

02. ගබඩාවේ අවසන්ව ඇති කාර්යාලයට අවශ්‍ය ලිපිද්‍රව්‍ය මිලදී ගැනිම සඳහා අනුමැතිය ලබා ගැනීම.

**08:03 2022-10-25 දිනැති සෞඛ්‍ය සන අපද්‍රව්‍ය හා පරිසර උපදේශන කමිටු වාර්තාව**

මෙදින සභාවට ඉදිරිපත් කරන ලද කාරක සභා වාර්තාවල සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

මෙහි දී අදහස් දක් වූ ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා පැවසූයේ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය මඟින් නොමිලේ වෛද්‍ය සායන පවත්වන අතර, ඒ සඳහා ඉඩ කඩ ප්‍රමාණවත් නොවන බැවින් බෝම්බුව සේවා පියසෙහි පවතින ඉඩම ඒ සඳහා ලබා දීම සුදුසු බවට තමන් සඳහන් කළ කාරණය කර්මාන්ත කමිටු වාර්තාවට ඇතුලත්ව නොමැති බවයි.

ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් ඒ සඳහා තුඹගොඩ විහාරස්ථානයේ ඉඩ ප්‍රමාණයක් වෙන් කර ගත හැකි අතර, එහි විහාරාධිපති හිමි ඒ සඳහා කැමැත්ත පළ කර ඇති බවයි.

ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා පැවසූයේ සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කමිටුවේ පැමිණීම සටහන් කිරීමේ දී නොපැමිණි ගරු නාගරික මන්ත්‍රීවරුන්ගෙන් නම් ඉදිරිපිට නොපැමිණි බවට සටහන් කරන ලෙසයි.

**ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා ප.ව 12.30 ට පමණ සභාවෙන් පිටවන ලදී.**

**09. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

2022-10-01 සිට 2022-10-31 දක්වා ආදායම් හා වියදම්

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | 11,488,510.59 |
| වෙනත් ලැබීම් | 16,143,057.93 |
| මුලු ලැබීම් | 27,621,568.52 |
| පුනරාවර්තන වියදම් | 10,812,020.04 |
| වෙනත් වියදම් | 11,977,768.91 |
| මුලු වියදම් | 22,638,006.33 |

2022-10-01 සිට 2022-10-31 දක්වා ඉන්ධන වාර්තාව

| **වාහන අංකය** | **මුළු එකතුව** |
|---|---|
| RD-8000 | 24,900.00 |
| 56-1906 | 45,650.00 |
| 227-5020 | 124,500.00 |
| GK - 6227 | 24,900.00 |
| CSM 0009 | 2,220.00 |
| 37 -7933 | 8,300.00 |
| BC-0005 | 70,550.00 |
| OV/M 0017 | 29,050.00 |
| LL - 7688 | 16,600.00 |
| JD-4684 | 5,180.00 |
| ND-5124 | 78,020.00 |
| PF-4006 | 187,995.00 |
| QL-2901 | 15,770.00 |
| FP- 0002 | 8,300.00 |
| GC 0001 | 740.00 |
| ZA 5039 | 66,400.00 |
| SDRRT 0013 | 4,980.00 |
| LL 2110 | 20,750.00 |
| UQ -1933 | 5,920.00 |
| RD - 8240 | 91,300.00 |
| 226 -7521 | 41,500.00 |
| ZA - 9835 | 4,150.00 |
| RE - 2600 | 69,160.00 |
| ZA - 0228 | 8,300.00 |
| HF 7899 | 58,100.00 |
| RC - 1118 | 64,325.00 |
| RC- 1107 | 49,800.00 |
| RB 4786 | 73,455.00 |
| එකතුව | **1,200,815.00** |

මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා සඳහා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**10. ඇස්තමේන්තු අනුමත කිරීම**

**11. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්**

**ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් තමන් කර්මාන්ත කමිටුවට ඉදිරිපත් කළ යෝජනා ඉටු කර නොමැති බව ද පොළ භූමියට නල මගින් ජලය ගෙන ඒමේ යෝජනාව කඩිනමින් ඉටු කරන ලෙසද පවසන ලදී.

මේ සම්බන්ධව වැඩ අධිකාරීතුමාගෙන් කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදි.

අදාල කරුණු පැහැදිලි කරගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත්කර ගන්නා ලදි.

නැවත වරක් ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් තුඹගොඩ විහාරස්ථානයේ කාණු පද්ධතියේ අඩුපාඩු කිහිපයක් තිබෙන බව ද මඟී නැවතුම්පළ ඉදි නොකිරීම නිසා පාසල් දරුවන් දැඩි අවධානමකට ලක්වන බව ද මේ නිසා හැකි ඉක්මනින් විහාරාධිපති හිමියන් සමඟ සාකච්ඡා කර අවශ්‍ය පියවර ගන්නා ලෙසද උඩකන්ද පාර අබලන් වී ඇති බැවින් ප්‍රිමික්ස් යොදා සකස් කර දෙන ලෙසද බස්නැවතුම්පළ විට කෙළ ගසා විනාශ කර ඇති අතර, එවැනි කටයුතු කරන පුද්ගලයන් සඳහා නීතිය ක්‍රියාත්මක කර දඩ මුදලක් හෝ අය කර ගැනීමට කටයුතු කරන ලෙසද පාසල් දරුවන්ගෙන් මෙවැනි දේ සිදුවන බවට ආරංචි ලැබී ඇති බැවින් පාසල් මට්ටමින් යම් දැනුවත් කිරීමක් කරන ලෙසද බස්නැවතුම්පළ පිරිසිදු කරන ලෙසද පුස්තකාලයේ නාම පුවරුව සකස් කර බළන්ගොඩ නගර සභා නාම පුවරුව නගර සභා කාර්යාලය ඉදිරිපිට සවි කරන ලෙසද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය අදහස් දක්වමින් බළන්ගොඩ මහජන ක්‍රීඩාංගනය අවුරුද්දේ මුල් මාස කිහිපය තුල පාසල් දරුවන්ගේ ක්‍රීඩා කටයුතු සඳහා අවශ්‍ය වන අතර, පවතින අධික වැසි තත්ත්වය මත කාණු යොදා ක්‍රීඩා පිටිය සකස් කිරීම අපහසු බව ද ආනන්ද මෛත්‍රී මාවතේ වල් බිහි වී ඇති නිසා වාහන අනතුරු පවා සිදු වන බැවින් එය සුද්ධ කර දෙන ලෙස ඉල්ලමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් කමිටු හරහා යෝජනා ක්‍රියාත්මක නොවීමට ප්‍රධාන හේතුවක් වන්නේ නිලධාරීන්ගේ අතපසු වීම් බවද කම්කරුවන් නොමැති බවට හේතු පවසන බැවින් ඒ සඳහා විසඳුමක් ලබා දෙන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින බව ද කොම්පෝස්ට් අංගනයේ සේවකයන් දින 20 ක් සේවය කරන අතර, එය දින 30 ක් දක්වා වැඩි කර දෙන ලෙස ඔවුන් විසින් ඉල්ලීමක් කර ඇති බව ද එසේ වුවහොත් වැඩි වැඩ ප්‍රමාණයක් කරගැනීමට හැකි වන බව ද සුසාන භූමිය ජලය ලබා ගැනීම සම්බන්ධව අවධානය යොමු කරන ලෙසද ආනන්ද මෛත්‍රී මාවත

වල් බිහි වී ඇති නමුත් එම මාර්ගය මාර්ග සංවර්ධන අධිකාරියට අයත් බැවින් එම ආයතනය දැනුවත් කර ලිපියක් යොමු කරන ලෙසද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් තුඹගොඩ මගී නැවතුම්පළ ඉදි කිරීම සඳහා මුලින් ඉදිරිපත් වූ අය මේ වන විට ඒ සඳහා සම්බන්ධ වීමක් සිදු නොවන බැවින් තමන් මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ සාකච්ඡා කළ අතර, මුදල් ප්‍රශ්න පවතින බව එහි දී සඳහන් කළ බව ද 2023 වර්ෂයේ අයවැය සඳහා මෙම යෝජනාව ඉදිරිපත් කර ඇති බවද ඇවිදින මංතීරුවේ පවතින අඩුපාඩු සම්බන්ධව අවධානය යොමු කරන ලෙස ද පැවසීය.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් පරගහකුඹුර හා ආචාරමලේ මාර්ගවල සුද්ධ කිරීමේ කටයුතු අවසන් කර තිබෙන අතර, ඒ සඳහා ස්තුතිවන්ත වන බව ද පරගහකුඹුර මාර්ගය අලුත්වැඩියා කර දෙන ලෙසද සභාවේ උදලු හා පිහි අඩුවක් පවතින බවද සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය මඟින් නොමිලේ පවත්වනු ලබන වෛද්‍ය සායනයන් ආරම්භ වන දිනය වෛද්‍යවරයාගෙන් ලිපියක් මඟින් විමසා එම කටයුතු සිදු කර දෙන ලෙසද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා අදහස් දක්වමින් කාර්මික නිලධාරීතුමා විශ්‍රාම පූර්ව නිවාඩු ලබා ගෙන ඇති නිසා ඒ වෙනුවට කොටස් වශයෙන් ගෙවීමේ ක්‍රමයකට කාර්මික නිලධාරියෙකු බඳවා ගැනීම සුදුසු බව ද ඒ සඳහා නවලෝක සමූහ ව්‍යාපාරයේ වැඩ කළ අයෙකු කැමැත්තෙන් සිටින බව ද පවසන ලදී.

**12. අවසානය**

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් තමන් අවංකව සේවය කළ නමුත් පසුගිය කාලයේ දී දෝෂාරෝපණ ලැබුණු බව ද උදෑසන 5 සිට සභාවෙන් සිදුවන සේවාවන් සම්බන්ධයෙන් සොයා බලා කටයුතු කරන අතර, ගරු නාගරික මන්ත්‍රීවරුන් අතරින් ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා හට බොහෝ උදව් කර ඇති බව ද ගරු නාගරික මන්ත්‍රීනි ජී.චන්ද්‍රලතා මැතිතුමිය හා සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය පළාත් පාලන ආයතනවල නිරීක්ෂණ චාරිකා සඳහා යොමු කළ බව ද මන්ත්‍රී කණ්ඩායමක් පුහුණුවීම් සඳහා යොමු කළ බව ද ලබන වසරේ ජනවාරි මාසය වන විට රුපියල් ලක්ෂ 700 ක අතිවිශාල ප්‍රදානයක් රාජ්‍ය නොවන සංවිධානයක් මඟින් බළන්ගොඩ නගර සභාවට පිරිනමන බව ද පවසන ලදී.

රටක් වශයෙන් ගත් විට දැනට අවුරුදු 30,40 කට පෙර තිබුණු රට අද වන විට දියුණු වී ඇති අතර, මංමාවත්, ජල විදුලිය හා දුරකතන මෙන්ම රටේ සියලු ක්ෂේත්‍රයන් දියුණු වී ඇති බව ද දේශපාලකයන් හොරකම් කරන බවට චෝදනා කළ විට සියලුම දේශපාලකයන් සඳහාම එය බලපාන බව ද මන්ත්‍රීවරයෙක් පත් වනු ලබන්නේ ජනතාවට සේවය කිරීම සඳහාම බව ද වැඩිදුරටත් පැවසීය.

එමෙන්ම බලය ලබා ගැනීමේ අරමුණින් දේශපාලකයන් වෙත චෝදනා එල්ල කරන අතර, මාධ්‍ය අධිකාරිය හා දෙමළ ඩයස්පෝරාව විසින් යම් යම් ගැටලු තත්ත්වයන් ඉස්මතු කර පෙන්වන බව ද මාධ්‍ය වගකීමෙන් යුක්තව කටයුතු කළ යුතු අතර, සභාවක් වශයෙන් සියලුම මන්ත්‍රීවරුන්ගේ යෝජනා ක්‍රියාත්මක කිරීමට තමන් කටයුතු කරන බව ද සභාවේ නිල කාලය වසර දෙකක් වන තුරු අයවැය

සම්මත වූ අයවැයක් වශයෙන් සලකන අතර, සභාවේ නිල කාලය වසර 04ක් ඉක්මවා ගොස් ඇති නමුත් තමාගේ නිල කාලය මාස 07 ක් බව ද මෙම අයවැය පරාද කළහොත් තමන් සභාපති ධූරයෙන් ඉවත් වන බව ද අයවැය සම්බන්ධ සාකච්ඡාවට නොපැමිණි ගරු මන්ත්‍රීවරුන් පිළිබඳ කණගාටුවට පත්වන බව ද සභා ඉතිහාසයේ අමාරුම අයවැය මෙවර සකස් කළ අතර, සියලු දෙනාගේ සහයෝගය ඒ සඳහා අපේක්ෂා කළ නමුත් එය නොලැබුණු බව ද පවසන ලදී.

ගරු සභාපතිතුමා තවදුරටත් අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා හට තමන් සභාපති වශයෙන් පත් වී මාස 06 කින් සභාපතිකම පිරිනමන බවට පැවසූ අතර, ඒ අනුව පසුගිය කාලයේ දී එතුමාට ඒ සඳහා ආරාධනය කළ නමුත් සභාපතිකම නිසා තමන්ගේ නිවාස දේපල පවා අහිමි වූ බැවින් සභාපතිකම ලබා ගැනීම අවශ්‍ය නොවන බවට සඳහන් කළ බව ද පවසමින් අද දින සභාවේ කටයුතු සාර්ථක කර ගැනීමට සහභාගි වූ ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් සියලු දෙනාට ස්තුතිය පළ කරමින් මෙදින මහ සභාවේ වැඩ කටයුතු ප.ව.01.28 ට පමණ අවසන් කරන ලදී.

ඩබ්.ඒ.වසන්ත ගුණරත්න,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.